# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 138/2024 (PSC)

ඩී.එල්.වීරසිංහ

**අභියාචක**

**එදිරිව**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**වගඋත්තරකරු**

**දිනය :- 2025.04.30**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)

ජේ.ජේ.රත්නසිරි (සාමාජික)

එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් ඔහුම පෙනී සිටී.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කසුනි පෙරේරා මිය

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා,**

## -නියෝගය-

අභියාචක විසින් **2024.07.23** දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම සම්බන්ධයෙන් වන පරීක්ෂණය, **2024.12.10** වෙනි දින ආරම්භ කරන ලදි. එහිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වා සිටියේ මෙම අභියාචනය, විනිශ්චය අධිකාරය වෙත කිසියම් අභියාචනයක් ඉදිරිපත් කළ යුතු නියමිත කාල පරිච්ඡේදය තුළ ඉදිරිපත් කර නොමැති හෙයින්, එම කරුණ මතම මෙම අභියාචනය නිෂ්ප්‍රභ කළ යුතු බවයි. අභියාචක විසින් **2024.08.27** දින යොදමින්, අමතර කරුණු ඇතුළත් කරමින් ඔහුගේ මුල් අභියාචනයේ පිටපතක් ඉදිරිපත් කර ඇත. එය මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත්තේ **2024.10.09** වෙනි දිනය. ඉදිරිපත් කරන ලද එකී ලේඛනය සමඟ අංක **02** ලෙස සළකුණු කර අමුණා ඇති **2024.06.24** දිනැති ලිපිය මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අභියාචක

වෙත දන්වා ඇත. ඉහත කී 2024.06.24 දිනැති ලිපියේ සඳහන් අභියෝගයට ලක්කර ඇති තීරණය ලබා දී ඇත්තේ, අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද 2023.11.23 දිනැති අභියාචනය සම්බන්ධයෙන් බවයි.

අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද එකී අභියාචනය වන්නේ, ඔහුට හිමිවිය යුතුව තිබූ වැටුප් වර්ධක නියමාකාරයෙන් ඔහු වෙත ලබා දී නොමැති බවයි. එම කරුණ ඉහත කී 2024.10.09 වෙනි දින මෙම විනිශ්වය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති ලේඛනයේ දෙවන පිටුවේ II වන ඡේදයෙන් ද පැහැදිලි වේ. එහි මෙසේ සඳහන් වේ.

" **ඒ අතර වසර 2002 න් පසු මා හට ලබාදුන් වැටුප් පරිවර්තන පත්‍රිකා තුළ සඳහන් වූයේ කඩඉමෙන් සමත්වෙන තෙක් වැටුප් වර්ධක සමාලෝචනය නොකරන බවයි"**

මෙම තත්ත්වය අංක 4 වශයෙන් සළකුණු කොට ඉදිරිපත් කර ඇති ලේඛනය මගින් ද තහවුරුවේ. ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචක වෙත යවන ලද 2024.06.24 දිනැති ලිපියේ ද සඳහන් වේ. ඒ අනුව පෙනී යන්නේ අභියාචකගේ ඉල්ලීම වන්නේ 2002 වර්ෂයෙන් පසු ඔහුට හිමිවිය යුතු වැටුප් වර්ධක ඔහු වෙත ලබාදී, ඉන් අනතුරුව ඔහුට හිමිවිය යුතු I ශ්‍රේණියට අදාළ උසස්වීම ලබාදෙන ලෙසත් ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම විනිශ්වය අධිකාරය වෙත එවන ලද 2025.04.02 දිනැති නිරීක්ෂණ වාර්තාවෙහි සඳහන් වන්නේ, කාර්මික සේවාවන්හී නියැලුනු අයට අදාළ සේවා කොන්දේසි අනුව එම නිලධාරීන්හට I ශ්‍රේණියට අදාළ උසස්වීම ලබා ගැනීම සඳහා විකල්පයන් දෙකක් ඇති බවයි. එකී සේවා කොන්දේසි ඇතුළත් ගැසට් පත්‍රයේ පිටපතක් ඉහතකී නිරීක්ෂණ සමඟ අමුණා ඇත. එකී කොන්දේසි 2006.01.06 දිනැති ගැසට් පත්‍රයේ 7.2 ඡේදයේ සඳහන් වේ. එම විකල්ප කොන්දේසි දෙක පහත දැක්වේ.

"**7.2 From Class II Segment A to Class I**

(a) Officers who have possessed a satisfactory service of 04 years in Class II Segment A, a satisfactory service at the date of promotion and have passed the Efficiency Bar Examination and

2nd Departmental Test prescribed for the officers in Class II Segment A shall be promoted to Class I.

(b) Officers who have possessed a service of 10 years in Class II Segment A, and having completed a 5 year satisfactory service preceding the date of promotion and have passed the Efficiency Bar Examination prescribed for officers in Class II Segment A shall be promoted to Class I."

**ඉහත කී පළවන කොන්දේසිය තුළට ඇතුළත් වන්නේ කාර්යක්ෂමතා කඩඉම සමත් වූ නිලධාරීන් ය. මෙම අභියාචක කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව නොමැති බව විවාදයෙන් තොරව පිළිගෙන ඇත. එසේ නම් මෙම නිලධාරියා I ශ්‍රේණියට උසස්වීම සඳහා සුදුසුකම් ලබන්නේ II සේවයේ (ආ) කාණ්ඩයේ වර්ෂ 10ක සේවා කාලයක් සම්පූර්ණ කරන්නේ නම් පමණකි. ඊට අමතරව ඉහත උසස්වීම් දිනයට පෙරකී වර්ෂ 05ක කාලයක සතුටුදායක සේවා කාලයක් ද තිබිය යුතුය. ඉහත කී 2(ආ) කණ්ඩයෙහි වර්ෂ 10ක සේවා කාලයක් අභියාචක සම්පූර්ණ කරනු ලබන්නේ, 2014.06.24 වෙනි දිනදීය. නමුත් එයට පෙර දිනයක එනම්, 2014.02.24 වෙනි දින අභියාචක සේවයෙන් විශ්‍රාම ගොස් ඇත.**

**ඉහත කී කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ අභියාචක විසින් ඉල්ලා ඇති I ශ්‍රේණිය සඳහා වන උසස්වීම ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් ඔහු විසින් සම්පූර්ණ කර නොමැති බවයි.**

**මෙම තත්ත්වය යටතේ අභියාචක විසින් ඉල්ලා සිටිනු ලබන සහනයන් ලබා දිමට ඉහත කී අවශ්‍යතාවයන් බාධකයක් වන හෙයින් 1 ශ්‍රේණියට සඳහා වන උසස්වීම ලබාදීමට හැකියාවක් ලැබෙන්නේ නැත.**

**ඉහත කරුණු සළකා බලා, ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.**

**මෙම තත්ත්වය යටතේ අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති ඉල්ලීම පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරී පනතේ 4 වන වගන්තියේ සඳහන් පරිදි නියමිත කාල පරිච්ජේදය තුළදී**

ඉදිරිපත් කර නොමැති බව පවසමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති විරෝධතාවයට අවධානය යොමු කිරීම අවශ්‍ය නොවේ.

ඉහත කී හේතූන් සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

ඒ අනුව අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-